# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - ගාල්ල

අවසාන වාර පරීක්ෂණය - 2000

**07 ශ්‍රේණිය**

**ගණිතය I**

| | |
|---|---|
| 7 | 2 |
| S | I |

කාලය : පැය දෙකයි.

---

* **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ( එක් ප්‍රශ්ණයකට ලකුණු 2 බැගිනි )**


(01) මිලියන → 1 000 000

බිලියන → 1 000 000 000

මේ අනුව බිලියනයට ඇති මිලයන ගණන කීය ද?

(02) 29 x 14 + 1 හි අගය ඔත්තේද? ඉරට්ටේද? යන්න සුළු කිරීමෙන් තොරව ලියා දක්වන්න.

(03) 56736 යන සංඛ්‍යාව නිරීක්ෂණය කර එය 4 න් බෙදෙන බව නිමල් පවසයි. නිමල් එම නිගමනයට එලඹුනේ කෙසේ ද?

(04) 

රූපයෙන් දැක්වෙන්නේ, කාඩ්බෝඩ්වලින් තනන ලද සම චතුරස්‍ර පිරමීඩයකි. එහි ඇති

1. මුහුණත් ගණන කීය ද?
2. ශීර්ෂ ගණන කීය ද?

(05) ඉහත පිරමීඩයේ දාර ගණන කීයද? මුහුණත් ගණනේත් ශීර්ෂ ගණනේත් ඓක්‍යය දාර ගණනට වඩා කීයක් වැඩි ද?

(06) 1m හා 5 cm දිග ලණුවක් සමාන කැබලි 07 ක් ලැබෙනසේ කපන ලදී. කැබැල්ලක දිග කොපමණ ද?

(07) m යනු සංඛ්‍යාවකි. එහි තුන් ගුණයට 02 ක් වැඩි සංඛ්‍යාව සඳහා ප්‍රකාශනයක් ලියන්න.

(08) $2x + 3x + 4$ යන්න පද 03 ක් සහිත වීජ ප්‍රකාශනයකි. මෙය පද දෙකක ප්‍රකාශනයක් ලෙස ලියන්න.

(09) සුළු කරන්න. $5y - 3y + y$

(10) එක්තරා කිරි පිටි පැකැට්ටුවක් 400 g බරින් යුක්තය. එවැනි පැකට් 8 ක මුළු බර කොපමණ ද?

| | |
|---|---|
| 7 | 2 |
| S | I |

(11) 0540h ට මාතරින් පිටත්වූ දුම්රියක් කොළඹ කොටුවට ලඟාවූයේ 0915 h ටය. ගමනට ගතවූ කාලය සොයන්න.

(12) $\frac{3}{4}$ , $\frac{7}{12}$ යන භාග අතුරින් විශාලතර භාගය කුමක් ද?

එම භාග දෙක " < " හෝ " > " ලකුණ යොදා නිවැරදිව සම්බන්ධ කරන්න.

(13) පහත දැක්වෙන සංඛ්‍යා අරෝහණ ක්‍රමයට ලියන්න.
0.3, 0.17, 0.256

(14) සුදත්ගේ බර 35.4 kg වන අතර අමිලගේ බර 43.56 kg වේ. දෙදෙනාගේම මුළු බර කොපමණ ද?

(15) අඩු කරන්න. $\frac{4}{5} - \frac{2}{3}$


To download past papers visit
www.vajirapani.blogspot.com

(16) සුළු කරන්න. $\frac{3}{5} \times 4$

(17) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් අගය සොයන්න.. 5 + (-1)

(18) P = 2 හා Q = 3 වන විට $2P^2Q^2$ හි අගය සොයන්න.

(19) රූපයෙන් දැක්වෙන්නේ, A හා B කේන්ද්‍ර වශයෙන් ගෙන ඇඳි වෘත්ත දෙකකි. කුඩා වෘත්තයේ අරය 3 cm වන අතර විශාල වෘත්තයේ අරය 5 cm වේ. BC දිග ගණනය කරන්න.




(20) මෙම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.

